ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ
දකුණු පළාත් සභාව

2002 අංක 02 දරණ

# සමාජසේවා ප්‍රඥප්තිය

දකුණු පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය
සටහන් කලේ 2002 ජූනි මස 20 වන දින

දකුණු පළාත් සභාවේ නියමය පරිදි
මුද්‍රණය කරන ලදී.

# දකුණු පළාත් සභාවේ 2002 අංක 02 දරණ සමාජ සේවා ප්‍රඥප්තිය

දකුණු පළාත තුළ දිළිඳු හා අසරණ ජන කොටස් සඳහා හා ආබාධිත පුද්ගලයින් සඳහා ආධාර සහ සහනාධාර ලබාදීම, වාසස්ථාන අහිමි වයෝවෘද්ධ තැනැත්තන් සඳහා වැඩිහිටි හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවා පවත්වා ගෙනයාම, විවිධ රෝගාබාධ සඳහා ආධාර සහ සහනාධාර සැපයීම ආදී වශයෙන් දකුණු පළාතේ ආර්ථික හා සමාජීය වශයෙන් පසුබෑමකට ලක්වූ ජන කොටස් වලට විවිධ සේවා හා පහසුකම් සැපයීම සඳහා ද එසේ පහසුකම් සලසන්නාවූ ස්වේච්ඡා සංවිධානවල කටයුතු විධිමත් කිරීම සඳහාද ඊට සම්බන්ධ හෝ අනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1. මේ ප්‍රඥප්තිය "දකුණු පළාත් සභාවේ අංක 02 දරන සමාජ සේවා ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුන දින සිට එය ක්‍රියාත්මක වන්නේය.

ප්‍රඥප්තියේ පරමාර්ථ

2. මේ ප්‍රඥප්තියේ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතුය.

(අ) දකුණු පළාත තුළ පදිංචි දිළිඳු හා අසරණ තැනැත්තන්ට සහ ආබාධිත තැනැත්තන්ට ආධාර හා සහනාධාර සැපයීම;

(ආ) වයෝවෘද්ධ තැනැත්තන් සඳහා නිවාස පිහිටුවීම හා පවත්වා ගෙනයාම;

(ඇ) ආබාධිත හා මන්ද බුද්ධික පුද්ගලයින් සඳහා නිවාස පිහිටුවා පවත්වා ගෙනයාම ඔවුන් සඳහා ආධාර හා සහනාධාර ලබාදීම සහ ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම;

(ඈ) හදිසි ව්‍යසන අවස්ථාවලදී විපතට පත්වූවන්ට සහනාධාර සැලැස්වීම;

(ඉ) විවිධ රෝගාබාධ සහිත තැනැත්තන්ට ආධාර හා සහනාධාර සැපයීම;

(ඊ) ඉහත කී කාර්යවල යෙදී සිටින ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම හා ඔවුන්ට අවශ්‍ය මග පෙන්වීම සහ

(උ) ආබාධිත හා මන්ද බුද්ධික පුද්ගලයින් සහ වැඩිහිටියන් සඳහා පවත්වා ගෙන යන ආයතනවලට ආධාර සැපයීම සහ ඒවා ඒකීමත් කිරීමට කටයුතු කිරීම;

(ඌ) ආබාධ සහිත පුද්ගලයන්ට උපකරණ සැපයීම.

පත් කිරීම 3. (1) 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 1 වන ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) අංක 7 යටතේ විමධ්‍යගත කරන ලද සමාජසේවා විෂය සඳහා සමාජසේවා දෙපාර්තමේන්තුව විසින් පත් කරනු ලැබ දකුණු පළාතේ ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල සේවයේ යොදවා සිටින සමාජ සේවා නිලධාරීන් මෙම ප්‍රඥප්තිය යටතේ දකුණු පළාත් සභාවේ සමාජසේවා අමාත්‍යාංශයට අනුයුක්ත කරනු ලැබිය හැකිය.

(2) දකුණු පළාත් සභාවේ සමාජ සේවා අමාත්‍යාංශයට පළාත් අධ්‍යක්ෂවරයෙකු සහ සමාජසේවා සහකාර ලේකම්වරයෙකු පත්කරනු ලැබිය යුතුය.

(3) මෙම ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා විසින් පවරනු ලබන කාර්ය හා කර්තව්‍ය යථා පරිදි ඉටු කිරීම සම්බන්ධයෙන් සමාජසේවා පළාත් අධ්‍යක්ෂ වරයා වගකිව යුතුය.

(4) පළාත් අධ්‍යක්ෂවරයාගේ බලතල හා කාර්යභාරය අමාත්‍යවරයා විසින් නිශ්චය කළයුතු අතර, මෙම ප්‍රඥප්තියේ පරමාර්ථ මුදුන් පත්කරගැනීම සඳහා ඔහු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියා කළ යුතුය.

(5) මේ ප්‍රඥප්තිය යටතේ අපේක්ෂිත කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සමාජසේවා නිලධාරීන් පත් කරනු ලැබිය හැකිය.

(6) මේ ප්‍රඥප්තිය යටතේ පත්කරනු ලබන සියලුම නිලධාරීන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ නිලධාරීන් ලෙස සලකනු ලැබිය යුතුය.

(7) මෙම ප්‍රඥප්තිය යටතේ ක්‍රියාකරන යම් රාජ්‍ය නිලධාරියකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද හෝ යම් කාර්යයක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිදු නඩුවක් නොවිය යුතුය.

(8) මෙම ප්‍රඥප්තියේ 3වන වගන්තියේ (3) වන සහ (4) වන උප වගන්ති යටතේ පත් කරන ලද සියලුම නිලධාරීන්, තම බලතල ක්‍රියාත්මක කිරීමේදී, අමාත්‍යවරයා විසින් හෝ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් හෝ නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ නියෝගවලට හා විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

දකුණු පළාත් සමාජසේවා අරමුදල් ගිණුම

4. (1) දකුණු පළාත් සමාජසේවා කටයුතු ඉටු කිරීමේදී ඉහත සඳහන් පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා (මෙහි මින් මතු "අරමුදල් ගිණුම" යනුවෙන් සඳහන් කරන්නාවූ) "දකුණු පළාත් සමාජසේවා අරමුදල් ගිණුම" යනුවෙන් හැඳින්වෙන්නා වූ ගිණුමක්, පළාත් සභාවේ අරමුදලේම ගිණුමක් වශයෙන් ආරම්භ කොට පවත්වාගෙන යා යුතුය.

(2) මෙම අරමුදල් ගිණුම, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ III වැනි කොටසේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

(3) මෙම අරමුදල් ගිණුමට, පහත සඳහන් මුදල් බැර කළ යුතුය:-

(අ) රජයේ මුදල් ආධාර වශයෙන් වරින්වර ප්‍රදානය කරනු ලබන මුදල්

(ආ) දකුණු පළාත් සභාව විසින්, අරමුදල් ගිණුමේ කාර්ය සඳහා සම්මත කරනු ලබන මුදල් ,

(ඇ) යම් පුද්ගලයකු , ආයතනයක් හෝ සංවිධානයක් මඟින් කෙරෙන පරිත්‍යාග මඟින් ලැබෙන සියලුම මුදල්;

(ඈ) පළාත් සභා පනතේ 22 වගන්තිය යටතේ රජය විසින් ලබා දෙන විදේශීය ආධාර වශයෙන් ලැබෙන සියලුම මුදල්;

(ඉ) සංදර්ශන, ලොතරැයි හා වෙනත් සම්මත ක්‍රමවලින් ලබා ගන්නා සියලුම මුදල්.

(4) මේ ප්‍රඥප්තියේ පරමාර්ථ ඉටුකර ගැනීමේ දී දරනු ලබන වියදම් සඳහා අවශ්‍ය වන සියළු මුදල් ඒ අරමුදලින් ගෙවිය යුතුය.

(5) එසේ වුව ද, යම් නිශ්චිත කාර්යයන් සඳහා යෙදවිය යුතුය යන කොන්දේසිය මත ඉහත (3) උප වගන්තියේ (ඇ), (ඈ) සහ (ඉ) ජේ. යටතේ මුදලක් ලැබුණු අවස්ථාවක එම මුදල් අරමුදලේ ගිණුමේ බැරට භාර ගැනීම අමාත්‍යවරයාගේ අභිමතය පරිදි විය යුතුය.

අරමුදල් ගිණුම පාලනය කිරීම

5. (1) අමාත්‍යවරයාගේ අභිමතය පරිදි, පත් කරනු ලබන මණ්ඩලයක උපදේශකත්වය යටතේ, අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව, අරමුදල් ගිණුම පවත්වාගෙන යෑමේ වගකීම අමාත්‍යාංශ ලේකම්වරයා සතුය.

(2) එක් එක් මුදල් වර්ෂය සඳහා සම්පූර්ණ ලෙස හා උචිත ලෙස ගිණුම් පවත්වාගෙන යෑමට ලේකම්වරයා විසින් විධිවිධාන සැලැස්විය යුතුය.

(3) එක් එක් මුදල් වර්ෂය අවසන්වී මාස 6 තුළ අරමුදල් ගිණුමේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් සකස් කළ යුතුය.

(4) 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ II විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, අරමුදල් ගිණුමේ මුදල් පාලනය සහ ගණන් හිල් සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

අරමුදල් ගිණුමේ මුදල් වර්ෂය

(5) අරමුදල් ගිණුමේ මුදල් වර්ෂය, මුදල් වර්ෂය විය යුතුය.

**අරමුදල් ගිණුම් මුදල් විගණනය**

6. (1) රාජ්‍ය ආයතනවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන [redacted] විධිවිධාන, දකුණු පළාත් සභා රීති, අරමුදල් ගිණුම්, ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාල විය යුතුය.

**අරමුදල් ගිණුම පිළිබඳ වාර්තා**

(2) අමාත්‍යවරයා විසින් ලිත් වර්ෂය අවසන්වී මාස 9ක් ඇතුළත එක් එක් ලිත් වර්ෂය සඳහාවූ අරමුදල් ගිණුම් පරිපාලනය ගැන වූ වාර්තාවක් ද, එම අරමුදල් ගිණුම් විගණනය කරන ලද එම වර්ෂයේ ගිණුම්වල පිටපතක්ද, එම ගණන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව සමග දකුණු පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයට හා දකුණු පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

**අරමුදලින් කරනු ලබන ගෙවීම්**

7. මෙම ප්‍රඥප්තියේ සඳහන් පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා කරනු ලබන වැඩ සටහන් වෙනුවෙන් අදාළ උපදේශක මණ්ඩලයේ නිර්දේශය මත, අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ගෙවීම් කටයුතු කළ හැකිය.

**ශිෂ්‍යත්ව පිහිටුවීම**

8. (1) අමාත්‍යවරයා විසින් පහත සඳහන් කාර්ය සඳහා ශිෂ්‍යත්ව පිහිටුවනු ලැබිය හැකිය.

(අ) සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ නව ප්‍රවේශයන් ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටළු හා පරිපාලන ක්ෂේත්‍රයේදී ඇතිවන අනුබද්ධ ගැටළු විසඳීමේ විධික්‍රම පිළිබඳව දැනුමක් ලබාදීම;

(ආ) සමාජසේවා සංවර්ධන ක්ෂේත්‍රයේ කටයුතු පිළිබඳ නියුක්ත සමාජසේවා නිළධාරීන්ට හා සමාජසේවා ආයතනවල අධිකාරීන්ට ඔවුන්ගේ කටයුතුවලට අදාල නව තාක්ෂණ දැනුම ලබාදීම;

(ඇ) ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ සංවර්ධන කාර්ය සඳහා ක්‍රියාශීලී දායකත්වයක් දක්වන ස්වේච්ඡා සමිතිවල හා කාන්තා බල මණ්ඩලවල සාමාජිකාවන්ට නායකත්වය හා වෙනත් කළමනාකරණ හැකියාවන් පිළිබඳව වැඩිපුර දැනුමක් ලබාදීම සහ;

(ඇ) ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ විවිධ ආබාධිත පුද්ගලයින්ට ඔවුන්ගේ නිර්මාණශීලී දක්ෂතා දියුණුකර ගැනීම සඳහා වැඩිපුර දැනුමක් ලබාදීම.

(2) ඉහත සඳහන් ශිෂ්‍යත්ව සඳහා දේශීය හා විදේශීය අරමුදල් උපයෝගී කර ගත හැකිය.

(3) මෙම ශිෂ්‍යත්ව සඳහා අරමුදල් යෙදවීම හා ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීම, අමාත්‍යවරයාගේ අවසාන තීරණයන්ට යටත්වේ.

ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම

9. (1) සමාජසේවා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරන ව්‍යවස්ථාව අනුව, කටයුතු කිරීමට සියළුම ලියාපදිංචි ස්වේච්ඡා සංවිධානවල නිලධාරීන් බැඳී සිටිය යුතුය.

(2) ලියාපදිංචි කරන ලද සියළුම ස්වේච්ඡා සමිතිවලට අදාල ලේඛනයක්, සමාජසේවා අමාත්‍යාංශය විසින් පවත්වා ගෙන යා යුතුය.

ස්වේච්ඡා සමිතියක හෝ සංවිධානයක කළමනාකරණ මණ්ඩල විසුරුවා හැරීම

10. (1) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට හා අනුමත ව්‍යවස්ථාවට පටහැනිව ක්‍රියා කරන බවට චෝදනා ලැබ, අමාත්‍යාංශ ලේකම්වරයාගේ නියෝගයක් පවත්වන ලද විධිමත් පරීක්ෂණයකින් වැරදිකරුවන් වන යම් ස්වේච්ඡා සමිතියක හෝ සංවිධානයක කළමනාකරණ මණ්ඩලය විසුරුවා හැරීමට, අමාත්‍යාංශ ලේකම්වරයාට බලය තිබේ.

(2) ඉහත සඳහන් ලෙස කළමනාකරණ මණ්ඩලය විසුරුවා හරින ලද සමිතියේ හෝ සංවිධානයේ ලියාපදිංචිය අවලංගු කිරීමට හෝ එය නැවත ප්‍රතිසංවිධානය කිරීමට හෝ අවශ්‍ය කටයුතු කිරීමට අමාත්‍යාංශ ලේකම්වරයාට බලය ඇ

(3) ලියාපදිංචිය අවලංගු කරන ලද සමිතියකට හෝ සංවිධානයකට අයත් සියළුම දේපළ සමාජසේවා අමාත්‍යාංශය වෙත පැවරේ. අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නම් කරනු ලබන නිලධාරියකුට එම දේපළ භාරදී නිදහස් වනතුරු, විසුරුවා හරින ලද නිලධාරී මණ්ඩලය වගකීමෙන් නිදහස් නොවේ.

අර්ථ නිරූපණය

11. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස "අමාත්‍යවරයා" යන්නෙන් දකුණු පළාත් සභාවේ සමාජසේවා විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"අමාත්‍යාංශ ලේකම්වරයා" යන්නෙන් දකුණු පළාත් සභාවේ සමාජ සේවා විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

"දේපළ" යන්නෙන් එවැනි සමිති සතු පොත්පත් ලේඛන, අත ඉතිරි හා බැංකුවේ ඇති මුදල්, ලී බඩු, උපකරණ, ගොඩනැගිලි හා ඉඩකඩම් යන සියළුම දේපළ අදහස් වේ.